# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 25 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 අගෝස්තු මස 08 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 අගෝස්තු මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 11.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

# 2014 අංක 25 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2014 අගෝස්තු මස 08 වැනි දින]

එල්.ඩී.—ඕ. 50/2011.

## 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2014 අංක 25 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1981 අංක 55 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනතේ දීර්ඝ නාමයේ "මූලික අධ්‍යයන ආයතනයක්" යන වචන වෙනුවට "ජාතික මූලික අධ්‍යයන ආයතනයක්" යන වචන ආදේශ කිරීමෙන් එකී පනතේ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට සහ ලිඛිත නීතියට කරනු ලබන සංශෝධන.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය" සහ "මූලික අධ්‍යයන ආයතනය" යන වචන යොදා ඇති අවස්ථාවල දී ඒ වෙනුවට "ජාතික මූලික අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය අඟවමින් යම් දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් යම් ලේඛනයක "ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයට" හෝ "මූලික අධ්‍යයන ආයතනයට" කරනු ලබන සෑම සඳහනක්ම "ජාතික මූලික අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාවට" කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්;

"(අඅ) (අ) ඡේදයට අදාළව පවත්වනු ලබන අධ්‍යයන කටයුතු තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන පරිදි රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.";

(2) එම වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්;

"(ඉ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතන විසින් ප්‍රදානය කරනු ලබන පශ්චාත් උපාධි සඳහා වූ පර්යේෂණ සඳහා පුහුණු කිරීම, මාර්ගෝපදේශකත්වය සහ සහයෝගය ලබා දීම;"

(3) එම වගන්තියේ (ඉ) ඡේදය එම වගන්තියේ (ඊ) ඡේදය වශයෙන් නැවත අංක යෙදීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"6. (1) ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් වෙත පැවරෙන අතර එය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයන්, එනම්:—

(i) විද්‍යා කටයුතු පිළිබඳ ජනාධිපති උපදේශක;

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා; සහ

(iii) ආයතනයේ අධ්‍යක්ෂවරයා;

(ආ) පහත දැක්වෙන පත් කළ සාමාජිකයන් ; එනම්:—

(i) ආයතනයේ කටයුතු පිළිබඳ විශේෂ සුදුසුකම් ඇති තැනැත්තන් අතරින් අවුරුදු තුනක කාලයක් සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන, ඔවුන් අතරින් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන, තැනැත්තන් සිව් දෙනකු; සහ

(ii) ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් විශේෂිත සුදුසුකම් සහිත තැනැත්තන් අතරින් අවුරුදු තුනක කාලයක් සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනකු ; සහ

(ඇ) අවුරුදු තුනක කාලයක් සඳහා හෝ යම් සාමාජිකයකු ශාස්ත්‍රීය සභාවේ සාමාජිකයකු වීම අවසන් වන දිනය දක්වා යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා, ශාස්ත්‍රීය සභාව විසින් ස්වකීය සාමාජිකයන් අතරින් තෝරාගනු ලබන (මෙහි මින් මතු "සභාවේ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් දෙදෙනකු.

(2) ස්වකීය පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයකින් පසුව ධුරය හිස් කරනු ලබන, විනයානුකූල හේතු නිසා ඉවත් කරනු ලැබූ සාමාජිකයන් හැර යම් පත් කළ සාමාජිකයකු හෝ සභාවේ සාමාජිකයකු නැවත පත්වීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(3) (i) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයකු ජනාධිපතිවරයා අමතන ලද ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගනු ලබන අවස්ථාවක දී බලාත්මක වන්නේ ය.

(ii) අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයකු හෝ සභාවේ සාමාජිකයකු විසින් ඕනෑම අවස්ථාවක දී අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දිනයක දී බලාත්මක වන්නේ ය.

(4) (i) ජනාධිපතිවරයා විසින් තත්කාර්ය සඳහා හේතු දැක්වීමෙන් පසුව තමා විසින් පත් කරන ලද යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ii) අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයකු හෝ සභාවේ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා හේතු දැක්වීමෙන් පසුව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (i) ජනාධිපතිවරයා විසින් පත් කරන ලද සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ඇති වන පුරප්පාඩුවක් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ජනාධිපතිවරයා විසින් පුරවනු ලැබිය යුතු ය.

(ii) අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් ඇති වන පුරප්පාඩුවක් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් පුරවනු ලැබිය යුතු ය.

(iii) පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉකුත් නොවී පවතින ධුර කාලය සඳහා ධුරය දරන්නේ ය.

(6) (i) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ යම් සාමාජිකයකු රෝගාතුරවීම, අබලතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් මාස තුනකට අඩු නොවන කාලයක් සඳහා තාවකාලිකව ස්වකීය ධුරයෙහි කටයුතු කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් එකී නොහැකියාව පිළිබඳව ලිඛිතව ජනාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ඔහු එම ධුරයෙහි කටයුතු කිරීමට අපොහොසත් වන කාලසීමාව සඳහා ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ යම් සාමාජිකයකු රෝගාතුරවීම, අබලතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් මාස තුනකට අඩු නොවන කාලයක් සඳහා තාවකාලිකව ස්වකීය ධුරයේ කටයුතු කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් එකී නොහැකියාව පිළිබඳව ලිඛිතව අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ඔහු එම ධුරයෙහි කටයුතු කිරීමට අපොහොසත්වන කාලසීමාව සඳහා ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකි ය.

(iii) සභාවේ සාමාජිකයකු රෝගාතුරවීම, අබලතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් මාස තුනකට අඩු නොවන කාලයක් සඳහා තාවකාලිකව ස්වකීය ධුරයේ කටයුතු

කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී, ඔහු විසින් එකී නොහැකියාව පිළිබඳව අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතු අතර, අමාත්‍යවරයා විසින් සභාවේ නිර්දේශය ඇතිව ඔහු එම ධූරයෙහි කටයුතු කිරීමට අපොහොසත්වන කාලය සඳහා ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් යම් තැනැත්තකු සභාපතිවරයා ලෙස තෝරාගනු ලැබිය යුතු ය."

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) මණ්ඩලය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබීම සඳහා සාමාජිකයන් දෙදෙනකු තෝරා ගැනීම සහ එවැනි යම් සාමාජිකයකු ඉවත් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම;".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය, පිළිවෙළින් "විපක්ෂ නායක" සහ "අග්‍රාමාත්‍යවරයා"යන යෙදුම්වල අර්ථ නිරූපණ ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** මේ පනත මගින් පිහිටුවනු ලබන ජාතික මූලික අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාව සියලු කාර්ය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු බව සැක දුරු කිරීමේ කාර්යය සඳහා ප්‍රකාශයට පත් කරනු ලබන අතර ඒ අනුව:— ඉතිරි කිරීම්.

(අ) ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය විසින් එළඹ ඇති සියලු කොන්ත්‍රාත් හා ගිවිසුම්;

(ආ) ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය විසින් හෝ එයට එරෙහිව පවරන ලද සියලු සිවිල් නඩු, අපරාධ නඩු, අභියාචන හා වෙනත් නීති කෘත්‍යයන්;

(ඇ) ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ වාසියට හෝ ඊට එරෙහිව ප්‍රකාශයට පත් කරන ලද සියලු නඩු තීන්දු හා ආඥා;

(ඈ) මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී පැවති ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ වෙනත් සියලු අයිතිවාසිකම්, බැරකම් හා බැඳීම්; සහ

(ඉ) අදාළ දිනයට පෙරාතුව ම වූ දිනය වන විට ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය සතුව පැවති හා එම ආයතනයේ අරමුණු උදෙසා භාවිත කරන ලද සියලුම චංචල හා නිශ්චල දේපල,

ජාතික මූලික අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාව මගින් අඛණ්ඩව පවත්වාගෙන යාම, බලාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

10. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.